# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 8 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය  කාලය : පැය 2

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) න්‍යෂ්ටික පවුලෙ සාමාජිකයෙකි.
  i) නැන්දා  iii) ආච්චි
  ii) මාමා  iv) අම්මා

(2) අප සිත තුළ පහළවන චිත්තවේගයකි.
  i) සතුට  iii) නැටීම
  ii) විලාප දීම  iv) සිනාසීම

(3) බ්‍රිතාන්‍ය යුගයේ ආරම්භ කළ පොදු සේවාවකි.
  i) විදුලිය  iii) තැපැල් හා විදුලි සංදේශ
  ii) සමුපකාර සේවාව  iv) සෞඛ්‍ය සේවාව

(4) පොදු සේවාවක් ලෙස අධ්‍යාපනය සපයන ආයතනයකි.
  i) සෞඛ්‍ය ආයතන  iii) පාසල්
  ii) රෝහල්  iv) රක්ෂණ ආයතන

(5) පරිසර සංරක්ෂණය සඳහා රජය මඟින් පිහිටුවා ඇති ආයතනයක් නොවන්නේ,
  i) බැංකු සේවා  iii) පරිසර අමාත්‍යාංශය
  ii) වනජීවී දෙපාර්තමේන්තුව  iv) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

- **හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

(6) අයහපත් චිත්තවේග තත්වයන් දිගින් දිගටම පැවතීම නිසා පුද්ගලයා කායික මානසික හා සාමාජීය වශයෙන් පිරිහේ. (   )

(7) සන්නිවේදන හැකියාව නායකයෙකු සතු ගුණාංගයකි. (   )

(8) පවුල් ඒකකය තුළ ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පවුල් අයහපතට හේතු වේ. (   )

(9) පාස්කු උත්සවය ක්‍රිස්තියානි භක්තිකයන්ගේ උත්සවයකි. (   )

(10) 2022 වර්ෂයේ සංගණනය අනුව රටේ වැඩිම ජනගහනයක් ඇත්තේ ඉස්ලාම් ජනතාවයි. (   )

- **(අ) කොටසේ නායකයින්ට අදාළව (ආ) කොටසෙන් අනුගාමිකයන් නිවැරදිව තෝරා ඉදිරිනේ ඇති තිත් ඉර මත ලියන්න.**

| (අ) | (ආ) |
|---|---|
| (11) විදුහල්පති | විෂය හදාරන ශිෂ්‍යයන් |
| (12) පන්තිභාර ගුරුවරයා | ගුරු මණ්ඩලය |
| (13) විහාරාධිපති | පන්තියේ ශිෂ්‍යයන් |
| (14) මන්ත්‍රීවරයා | රට වැසියන් |
| (15) විෂය නායකයා | ඡන්ද දායකයන් |
| | දායක දායිකාවන් |

- **15 - 20 තෙක් හිස්තැනට ගැලපෙන වචනය ලියන්න.**

**(කැලිෆෝනියා, 119, 118, තමිල්නාඩු, රතුකුරුස)**

(16) අනතුරු හා ආපදාවලදී ....................................... සංවිධානය සහය වේ.

(17) ඇමරිකා එක්සත් ජනපදයට ....................................... ප්‍රාන්තය අයත් වේ.

(18) පොලිස් හදිසි දුරකතන අංකය ....................................... වේ.

(19) පරිසරය හා ස්වභාවික සම්පත් සම්බන්ධ පැමිණිලි සඳහා ....................................... දුරකතන අංකය භාවිතා කළ හැක.

(20) ....................................... ඉන්දියාවට අයත් ප්‍රාන්තයකි.

## II කොටස

- **ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

1)

i) පොදු සේවා සපයන ආකාරය අනුව කොටස් 3කි. ඒ මොනවාද? (ල. 3)

ii) අපට පොදු සේවා අවශ්‍යවන්නේ ඇයි දැයි කරුණු 4කින් දක්වන්න. (ල. 4)

iii) සෞඛ්‍ය සේවය මඟින් ඉටුකරන කාර්යයන් 3ක් ලියා එකක් විස්තර කරන්න. (ල. 5)

2)

i) පොදු සේවාවන් 3ක් ලියන්න. (ල. 3)

ii) අධ්‍යාපනය මඟින් ඉටු කරන කාර්යයන් 4ක් ලියන්න. (ල. 4)

iii) අධ්‍යාපනය වෙනුවෙන් රජය ගෙන ඇති පියවර 5ක් ලියන්න. (ල. 5)

3)

i) පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 3ක් ලියන්න. (ල. 3)

ii) පහත සඳහන් අයිතීන්ට අදාළව ඔබගෙන් ඉටු විය යුතු යුතුකම් දෙක බැගින් ලියන්න. (ල. 4)

(අ) අධ්‍යාපනය ලැබීම

(ආ) මිතුරු සබඳතා පැවැත්වීම

iii) අයහපත් චිත්තවේග සමනය සඳහා මනස සන්සුන් කිරීමේ අභ්‍යාස 5ක් ලියන්න. (ල. 5)

4)

i) නායකයෙකු සතු ගුණාංග 3ක් ලියන්න. (ල. 3)

ii) ඒකාධිපති නායකත්ව ශෛලියේ ලක්ෂණ 2ක් හා දූෂිත නායකත්ව ශෛලියේ ලක්‍ෂණ 2ක් ලියන්න. (ල. 4)

iii) ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාල ගුණාංග 3ක් ලියා එයින් එකක් විස්තර කරන්න. (ල. 5)

5)

i) බහු සංස්කෘතික ජන සමාජ ඇති රටවල් 3ක් ලියන්න. (ල. 3)

ii) අපේ රටේ ආගම් පදනම් කොටගෙන ගොඩනැඟී ඇති සංස්කෘති 4ක් ලියන්න. (ල. 4)

iii) බෞද්ධයන්ට වැදගත් ආගමික උත්සව 3ක් ලියා එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

6)

i) ස්වභාවික විපත් 2ක් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපතක් ලියන්න. (ල. 3)

ii) ගංවතුරින් සිදුවන හානි අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 4ක් ලියන්න. (ල. 4)

iii) අනතුරු හා ආපදා සම්බන්ධව කටයුතු කරන ආයතන 3ක් සඳහන් කර එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

7)

i) මාර්ග අනතුරු සිදුවීමට බලපාන මූලික හේතු 3ක් ලියන්න. (ල. 3)

ii) මාර්ග අනතුරු වලක්වා ගැනීමට රියදුරන්ගේ වගකීම් 2ක් හා රජයේ වගකීම් 2ක් ලියන්න. (ල. 4)

iii) දුම්රිය අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 3ක් දක්වා එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)